# <u>නිවේදනය</u>

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම 2019(2020)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම 2019(2020) සඳහා එක් එක් විෂය යටතේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව විෂයන් අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සියලුදෙනාගේ නම් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන දින සහ ඊට අදාල අනෙකුත් විස්තර මෙම වෙබ් අඩවියේම මේ වන විටත් පළ කර ඇත.

මෙම නාම ලේඛනයේ නම සඳහන් වීම/ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා තිබීම පමණක් අදාල පත්වීම් ලැබීමට සුදුසුකමක් නොවේ.

මෙහි ඇමුණුම 01 වශයෙන් දැක්වෙන ආකෘතිය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර එය අදාල විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගේ අත්සනින්ම තහවුරු කර තිබිය යුතුය. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ මූලික සුදුසුකම් ලෙස ඉදිරිපත් කිරීමට නියමිත ඔබ සතු සියලුම උපාධි, පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා මෙම ආකෘතිය අනුව අදාල උපාධි පාඨමාලාවේ අන්තර්ගත විෂයය ඒකක ප්‍රමාණය තහවුරු කර ඉදිරිපත් කිරිම අනිවාර්යය බැවින්** සහ මෙම ආකෘතිය පසු අවස්ථාවක ඉදිරිපත් කළහොත් බාර නොගන්නා බැවින් මෙය වෙබ් අඩවියෙන් බාගත කරගෙන කඩිනමින් සම්පූර්ණ කරවා ගැනීම අයදුම්කරුගේ වගකීමක් වේ.